**ශීර්ෂ 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) කෑගල්ල

(ආ) මාවනැල්ල

(ඇ) අරණායක

(ඈ) බුලත්කොහුපිටිය

(ඉ) රඹුක්කන

(ඊ) ගලිගමුව

(උ) වරකාපොල

(ඌ) දෙහිඕවිට

(එ) රුවන්වැල්ල

(ඒ) යටියන්තොට

(ඔ) දැරණියගල

1.1 **විගණන විෂය පථය**

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 08 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා

සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.	ගිණුම්**

**2.1	විසර්ජන ගිණුම**

**(අ)	මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 588 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 551 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 37 ක් හෙවත් සියයට 6 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 518 | 507 | 11 | 2 |
| මූලධන | 70 | 44 | 26 | 37 |
| එකතුව | 588 | 551 | 37 | 6 |

**(ආ)	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 27 කින් හා දෙපාර්තමේන්තු 20 කින් සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් රු.මිලියන 747 ක් හා රු.මිලියන1,556 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,303 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එවා තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 658 ක් හා රු.මිලියන 1,386 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,044 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය පිළිවෙලින් රු.මිලියන 89 ක් හා රු.මිලියන 170 ක් වශයෙන් එකතුව රු.මිලියන 259 ක් වී තිබුණි. එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනයන් කළ පසු ඉතිරිය සියයට 0.07 සිට සියයට 95.58 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27901 | 38 | 33.4 | 30 | 29.8 | 150.6 | 135.3 |

**2.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 462.4 ක් වී තිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 557.6 ක් වී තිබුණි.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

3. ශීර්ෂ 279- **කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**3.2 සීමා නොපිළිපැදීම**

---

2013 අංක 36 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 27901 යටතේ වන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් සීමාව රු.30,000,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සත්‍ය ලැබීම රු.29,838,113 ක් වීම නිසා රු.161,887 කින් අවම ලැබීම් සීමාවට ළඟාවී නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

---

**වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

---

ශීර්ෂ 105 හා 120 යටතේ අමාත්‍යාංශ දෙකක් විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගලිගමුව හා දැරණියගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ප්‍රතිලාභින් වෙත බෙදා හැරීම් සඳහා එකතුව රු.4,791,041 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණත්, එම භාණ්ඩ 2014 පෙබරවාරි මාසය වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදාහැර නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

---

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.89,801,535 ක් වූ තැන්පතු 150 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 27901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,069,438 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමට අදාලව ණයගැති හා ණයහිමි ලේඛන පවත්වා නොතිබීම, සාමාජික ණය ලේඛනය හා පාලන ගිණුම අතර වෙනස්කම් පැවතීම, ආපදා ණය ගෙවීමේදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.5 වගන්තියට පටහැනිව

සියයට 40 අවකරණ සීමාව සැලකිල්ලට ගෙන නොතිබීම, පෞද්ගලික ලිපිගොනුවල ණයකාඩ්පත් නොතිබීම යනාදි අඩුපාඩු නිරීක්ෂණය විය.

**3.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම හා ඉදිකිරීම් සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

ජපන් ආධාර යටතේ අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබූ ටේලර් බවුසරයක් සහ යතුරුපැදියක් 2015 ජූලි මාසය වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශීය ලේකම්වරයෙකු 2012 සැප්තැම්බර් 18 දින ස්ථාන මාරුවීම් ලබා තිබුණද, 2015 මාර්තු 23 දින වන විටත්, ඔහු පදිංචිව සිටි නිල නිවස සහ වට්ටෝරු භාණ්ඩ භාරදී නොතිබුණු අතර, ස්ථාන මාරුවූ දින සිට හිඟ ගෙවල් කුලී සහ දුරකථන බිල්පත් ද ගෙවා නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.531,878 ක් වූ භාණ්ඩ මිලදී ගෙන තිබුණි. මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාරව අවස්ථා 03 කදී එම භාණ්ඩ ගබඩාවට ලැබී තිබුණු බව සනාථ කිරීම සඳහා අදාල බඩු ලේඛනයෙහි හෝ තොග පොත්වල සටහන් යෙදා ඇති බව වගකිව නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි.

**3.9 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දැරණියගල හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2014 වර්ෂයේදී වැඩ අවසන් කිරීමට සැලැසුම් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.8,867,000 ක් වූ ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත්ව සැලැසුම් කර නොතිබීම නිසා 2015 පෙබරවාරි මාසය වන විටත් එහි වැඩ ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

**(ආ) ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිමනොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2014 දෙසැම්බර් 31 දින වනවිට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| කෑගල්ල නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීම | 294,982,342 | 2011.05.10 | 62,139,332 | කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය හා ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |
| බුලත්කොහුපිටිය සතිපොල ඉදිකිරීම | 34,385,051 | 2014.01.01 | 854,978 | |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

2014 වර්ෂයේදී වැඩ අවසන් කිරීමට සැලැසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. 14,694,160 ක් වූ දැරණියගල සිරිසමන් විද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය නිසා 2015 මාර්තු මාසය වන විටත් අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට රු.7,573,770 ක් වැයකර තිබුණි.

**(ඈ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා මුදල් නිදහස් කර තිබුණත් එම ව්‍යාපෘතිවලින් ප්‍රගතියක් ලබා නොතිබුණි.

(i) නියැදි විගණන පරීක්ෂණයට අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.7,651,781 ක් ගෙවා තිබුණද, 2015 මාර්තු මාසය වන විටත් ඉන් ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර නොතිබුණි. එක්

ව්‍යාපෘතියක පොම්පාගාරය පෞද්ගලික ඉඩමක ඉදිකර තිබුණු අතර, සමහර වැඩ විෂයයන් ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) දිප්පිටිය සතිපොල I සහ II අදියර ඉදිකිරීම සඳහා 2015 මාර්තු මාසය වන විට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු.12,030,451 ක් ගෙවා තිබුණද, ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් කුළුණු පොලව මට්ටමට පමණක් නිමකර තිබුණි. විශාල වියදමක් කර මුල් ඇස්තමේන්තුවේ නොතිබුණු පැති බැම්මක් ඉදිකර තිබුණි. එහි II අදියර සඳහා සංශෝධිත සැලැස්මක්ද සකස් කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ අතිරේක වැඩ සඳහා රු.1,000,866 ක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය යන සියළු කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින්ම ඉටු කර තිබීම නිසා අතිරේක වැඩ ප්‍රමාණයේ නිවැරදිතාවය පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

(iii) තට්ටු දෙකකින් සමන්විත තුත්තිරිපිටිය බස් නැවතුම්පල සඳහා රු.24,440,263 ක ඇස්තමේන්තුවකට ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාරදී 2014 අගෝස්තු 31 දින වැඩ අවසන් කළ යුතුව තිබුණද, 2015 මාර්තු 19 දින වනවිට, වහලය රහිතව ගොඩනැගිල්ලේ සැකිල්ල පමණක් සිමෙන්ති ගල්වලින් සකස් කර තිබුණි. මෙම බස් නැවතුම්පලෙහි අවශ්‍යතාවය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණු අතර, ජන ශූන්‍ය ප්‍රදේශයක එය ඉදිකිරීම මතභේදයට තුඩු දෙන කරුණක් විය. එමෙන්ම ගොඩනැගිල්ලේ බිත්ති අඟල් 6 පළලට බැඳීම වෙනුවෙන් රු.175,661 ක් ගෙවා තිබුණද, එම බිත්ති අඟල් 4 පළලට බැඳ තිබුණු අතර, යොදා තිබූ සිමෙන්ති ගල් හා ඉදිකර තිබූ කොන්ක්‍රීට් කුළුණු නිසි ප්‍රමිතියකින් නොතිබුණි. බස් නැවතුම්පලේ අනුමත ගොඩනැගිලි සැලැසුම අනුව බිම් මහලේ වර්ගඵලය මි.මී. 23625 x 9675 ප්‍රමාණයෙන් යුතු වුවත්, භෞතික පරීක්ෂාව අනුව එය මි.මී.20800 x 8700 ක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඉ) ඉටු නොකළ වැඩ වෙනුවෙන් ගෙවීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇස්තමේන්තු වටිනාකම රු.21,469,815 ක් වූ බුලත්කොහුපිටිය ආදාහනාගාරය ඉදිකිරීම සඳහා වූ කර්මාන්තයේ 2015 මාර්තු 20 දින කරන ලද භෞතික පරීක්ෂාවට අනුව ඉටු නොකළ වැඩ සඳහා වැඩිපුර රු.717,018 ක් ගෙවා තිබුණි. තවද, ගෙවීම් වාර්තාව අනුව ගොඩනැගිල්ලේ බිත්ති 6" පළලට බැඳීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද, එම බිත්ති 4" පළලට බැඳ තිබුණු අතර, බිත්ති 6" පළලට බැඳීම වෙනුවෙන් රු.150,738 ක් ගෙවා තිබුණි.

(ii) පාරවල් කොන්ක්‍රීට් කිරීමේදී, ෂටරින් ලෑලි නැවත නැවත යොදාගැනීමේ හැකියාව මත මුළු දිග ප්‍රමාණයෙන් 1/3 ක් සඳහා ගෙවිය යුතු වුවත්, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්පූර්ණ ප්‍රමාණයම මත ෂටරින් සඳහා කර්මාන්ත 23 ක් වෙනුවෙන් රු.356,573 ක් ගෙවා තිබුණි.

(iii) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සභාව හරහා ඉටු කරගන්නා ලද කර්මාන්ත 22 පරීක්ෂා කිරීමේදී, කොන්ක්‍රීට් කරනු ලබන සියලුම පාරවල්වලට ABC මිශ්‍රණය යොදා කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තු කර රු.785,981 ගෙවා තිබුණද, ABC මිශ්‍රණය අතුරා නොතිබුණි.

## 3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දික්ඇල්ල කන්ද සිරිපා මාවත කොන්ක්‍රීට් කිරීම සඳහා 2014 දෙසැම්බර් 29 දින රු.392,000 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් 2015 පෙබරවාරි 26 දින භෞතික පරීක්ෂාවට අනුව මාර්ගය ප්‍රමාණයට වඩා දිගින් හා පළලින් යුතුව නිමකර තිබුණු අතර එම වැඩිපුර කර තිබුණු ප්‍රමාණය මාර්ගය භාවිතා කරන කුඩා ජලවිදුලි බලාගාර ආයතනයක සහයෝගයෙන් සිදුකළ බවට කාර්මික නිලධාරී විසින් ප්‍රකාශ කර තිබුණි. මේ පිළිබඳව ලිපිගොනුවේ සටහනක් නොතිබුණු බැවින් බාහිර ආයතනය මගින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉටුකළ ප්‍රමාණයන් පැහැදිලිව හඳුනා ගැනිමට නොහැකි විය.

## 3.11 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 18 දිනැති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත 2013 දෙසැම්බර් 31 දින රු.1,053,500 ක් වැයකර පරිගණක යන්ත්‍ර 06 ක්, ලැප්ටොප් 03 ක් හා යූ.පී.එස්. 06 ක් මිලදීගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශයට පටහැනිව ඉහත මිල ගණන් පදනම් කරගෙන මුල් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 500 ක වටිනාකමැති භාණ්ඩ නැවත ඇනවුම් කර 2013 දෙසැම්බර් 31 දින එකතුව රු.3,367,800 ක් වූ පරිගණක හා යූ.පී.එස්. යන්ත්‍ර 30 ක් බැගින් මිලදීගෙන තිබුණි. මිලදීගෙන තිබූ පරිගණකවල මෙහෙයුම් පද්ධතිය හා දෘඩ තැටිය සපයා තිබූ පිරිවිතරයන්ට වඩා අඩු මට්ටමක වූ අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශය ප්‍රකාරව සපයන ලද භාණ්ඩ, පිරිවිතරවලට සහ වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බවටත්, වගකීම් සහතික, සුරක්ෂණ සහතික සහ අත්පොත් එකඟ වූ අයුරු සපයා ඇති බවටත්, සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(ආ) කෑගල්ල දිස්ත්‍රික්කයේ අළුතින් ඉදිකරන සහ වැඩිදියුණු කරන මාතෘ සායනවලට අවශ්‍ය උපකරණ 2013 දෙසැම්බර් 31 දින රු.15,522,895 ක් වැයකර මිලදී ගෙන තිබුණු අතර එම උපකරණ 2014 දෙසැම්බර් 10 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. ලංසු කැඳවීමේදී විවෘත වෙළඳපලෙන් මිල ගණන් කැඳවා නොතිබුණු අතර ඒ සඳහා ප්‍රමාණවත් කාල වේලාවන් නොතිබීම හා මාතෘ සායන 2014 පෙබරවාරි 04 දිනට ප්‍රථම විවෘත කිරීමට නියමිතව තිබීම යන්න හේතු වශයෙන් සඳහන් කර තිබුණි. 2014 දෙසැම්බර් 10 දින වන විටත් කිසිදු මාතෘ සායනයක් ඉදිකිරීම් නිමකර විවෘත කර නොතිබූ අතර, මිලදීගෙන තිබූ උපකරණ පාවිච්චියෙන් තොරවම වගකීම් කාලය ඉකුත් වීමට ආසන්නව පැවැතුණි.

### 3.12 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

66 වන නිදහස් උළෙල පැවැත්වූ කෑගල්ල නිදහස් මාවතේ පොල භූමිය අසල කඩ කාමරවල අපවිත්‍ර බිත්ති ටකරං තහඩු යොදා ආවරණය කිරීම සඳහා රු.1,950,839 ක් වැයකර තිබුණි. එම කර්මාන්තය සඳහා ලංසු කැඳවීමේදී මියගිය පුද්ගලයින්ගේ හා එම කර්මාන්තයේ නිරත නොවන, තෝරාගත් සැපයුම්කරුගේ ඥාතීන්ගේ නම් හා ලිපිනයන් යොදා කලින් තෝරාගත් සැපයුම්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව ලබා දීමට කටයුතු කර තිබුණි. ලංසු කැඳවීමේදී, එම ආවරණය පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තහඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සැපයෙන බව දන්වා තිබීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එම තහඩු මිලදී ගැනීමටත්, ඒවා ගලවා ඉවත් කර ගැනීමට කුලී ලබා දීමටත්, එකතුව රු.1,031,615 ක අමතර වියදමක් සිදු කර තිබුණි.

### 3.13 පාඩු හා හානි

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ්රථයක් 2011 ජුනි 24 දින අනතුරට ලක්වීම නිසා රු.277,300 ක අලාභ හානියක් සිදුවී තිබූ අතර එයින් රු.167,250 ක් රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුණි. මෙම අනතුරට අදාල නඩු විභාගයේදී කැබ්රථයට පිටු පසින් පැමිණි රථයේ රියදුරු වැරදිකරු වී තිබූ අතර, තවදුරටත් අයවියයුතු රු.110,050 ක අලාභ හානිය, අදාල පාර්ශවයෙන් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.14 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කිතුල්ගල සතිපොලෙහි ගොඩනැගිලි 3 ක් හා වැසිකිලි පද්ධතියක් සකස් කිරීමට රු.17,342,757 ක ඇස්තමේන්තුවක් සකස්කර 2013 දෙසැම්බර් 25 දිනට පෙර ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට පවරා තිබුණි. ඉන් එක් ගොඩනැගිල්ලක් පමණක් ඉදිකර තිබුණු අතර 2014 ජනවාරි 17 දින මුල් ඇස්තමේන්තුවේ නොමැති පැති බැම්මක්ද

ඇතුළත්ව ඉතිරි ගොඩනැගිලි දෙක හා වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා රු.33,072,352 ක වටිනාකමැති ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. විගණන අවස්ථාව වනවිට, කළ වැඩ වටිනාකම සඳහා සහ උපදේශක සේවා ගාස්තු සඳහා එකතුව රු.3,177,612 ක් ගෙවා තිබුණි. පැතිබැම්ම හා පස් පුරවන ලද භූමිය තුළ ඉදිකිරීම් කිසිවක් සිදුකර නොතිබුණු අතර, එම ස්ථානයේ සතිපොළද පවත්වා නොතිබුණු බැවින් එකී භූමිය කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ආ) වල්පොලගම පානීය ජල යෝජනා ක්‍රමය යටතේ වූ ඉදිකිරීම් සඳහා රු.980,392 කට 2012 අගෝස්තු 20 දින කොන්ත්‍රාත්කාර සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2013 මාර්තු 31 දින රු.882,328 ක් කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබුණි. 2015 මාර්තු මාසයේ භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට ඇස්තමේන්තු වැඩ විෂය 07 ක් නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකර තිබුණු අතර, පොම්පාගාරයේ සිට ජල ගබඩා ටැංකිය දක්වා එලා තිබූ 1½" ජලනල ස්ථාන කිහිපයකින් කැඩී වෙන් වී තිබුණි. පොම්පාගාරයට සපයා තිබූ විදුලිය විසන්ධි වී තිබීම, ටැංකිය ජලය නොමැතිව විවෘත කර තිබීම යන කරුණු හේතු කොට ගෙන එහි ප්‍රධාන අරමුණ වන ගම්වාසීන්ට පානීය ජලය සැපයීම සිදු කර නොතිබුණි. මේ සඳහා ප්‍රජා දායකත්වය සමග දරන ලද රු.1,247,069 ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

### 3.15 මානව සම්පත් කළමනාකරණය

#### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 37 | 5 | - |
| (ii) තෘතියික මට්ටම | 30 | 22 | 8 | - |
| (iii) ද්විතියික මට්ටම | 1,037 | 1,007 | 32 | 2 |
| (iv) ප්‍රාථමික මට්ටම | 115 | 109 | 15 | 9 |
| (v) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | - | - | - |
| **එකතුව** | **1,224** | **1,175** | **60** | **11** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයෙන් පසු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිශෝධනයට ලක්වී නොතිබුණි.

(ආ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අත්‍යාවශ්‍ය තනතුරු වන කළමනාකරණ සහකාර සේවයේ (අධි පංති) (A.O), සංවර්ධන සම්බන්ධීකරණ, භාෂා පරිවර්තක, සැලැසුම් ශිල්පී, මුරකරු හා සනීපාරක්ෂක කම්කරු වැනි අත්‍යාවශ්‍ය තනතුරු ඇතුළු තනතුරු 10 ක පුරප්පාඩු 11 ක් පැවතුණි.